# පළාත් පාලන ඡන්දය කල් දැමීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්

## - පැෆරල් සංවිධානය

රනිල් ධර්මසේන

විවිධ හේතූන් කියමින් පළාත් පාලන මැතිවරණය කල් දැමීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක් බව පැෆරල් සංවිධානය පවසයි. පළාත් පාලන සීමා නිර්ණය ගැටලු නිරාකරණය කිරීමේ කටයුතු සිදුකරන බව පවසමින් මාස ...

04-පිටුවට

## පළාත් පාලන ...

**ගණනක සිට ඡන්ද විමසීම ආණ්ඩුව කල් දමන බවද එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා "දිවයින"ට පැවැසීය.**

ඉකුත් ජනවාරි මාසයේදී වාර්තාව සකස් කර අවසන් කරන බවට සීමා නිර්ණ වාර්තාව නිවැරදි කිරීමට පත්කළ විශේෂ කමිටුවේ සභාපතිවරයා ප්‍රකාශ කළ බවත් ඉන්පසුව ඔහු අප්‍රේල් මාසයට පෙර අවසන් කරන බව ප්‍රකාශ කළ අතර දැන් අගෝස්තු මාසයේදී අවසන් කරන බව කියා සිටින බවද හෙට්ටිආරච්චි මහතා කීය. මෙලෙස ස්ථිර වචනයක් නොමැතිව කල් දැමීම නිසා සභාපතිවරයාගේ හා ඇමැතිවරයාගේ ප්‍රකාශ විශ්වාස කළ නොහැකි මට්ටමට පත්වනු ඇති බවද පැවැසීය.

ආණ්ඩුව සිය ප්‍රජාතන්ත්‍රවාදී බව පෙන්විය යුතු නම් අවම තරමින් සීමා නිර්ණ ගැටලු නැති පළාත් පාලන ආයතනවල මැතිවරණය හෝ මුලින් පවත්වා පසුව සෙසු ආයතනවල මැතිවරණ පැවැත්විය හැකි බවද හෙතෙම කීය. කඩින් කඩ මැතිවරණ පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදයට හානිකර නමුත් විවිධ හේතු දමා මැතිවරණ කල්දැමීම ඊටත් වඩා ප්‍රජාතන්ත්‍ර විරෝධී බවද ඔහු පැවැසීය.

ජනතාවගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමට ස්වාධීන මැතිවරණ කොමිසමේ වගකීමක් යැයිද මේ පිළිබඳව ඉදිරියේදී සියලු මැතිවරණ නිරීක්ෂණ සංවිධාන එක්ව කොමිසමේ සභාපතිවරයා හමුවීමට කටයුතු කරන බවද හෙතෙම කියා සිටියේය.